


# ද්‍රවිඩ මන්ත්‍රී මහේෂ්වරන් 1 දා ඝාතනයට ලක්වේ



**නා**දුනන තුවක්කු කරුවෙකු විසින් ජනවාරි 1 දා උදේ 10 ට පමණ එක්සත් ජාතික පක්ෂයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ත්‍යාග රාජා මහේෂ්වරන් මහතා කොළඹ කොටහේනේ සිවම් නමැති හින්දු කෝවිලක පූජාවට සහභාගිවෙමින් සිටියදී වෙඩිතබා ඝාතනය නරන ලදී. බරපතල ලෙස තුවාල වීවීමෙන් අනතුරුව වහා කොළඹ මහ රෝහලට ගෙනයනු ලැබ මන්ත්‍රීවරයා එහිදී මිය ගියේය. 41 වැනි වියේ පසුවූ මහේෂ් වරන් කුඩා දරුවන් තිදෙනෙකු ගේ පියෙකි. මෙම වෙඩි තැබීමේදී මන්ත්‍රීවරයාගේ ආරක්ෂකයෙකු ද මියගොස් ඇත. වෙඩි පහරලත් ඝාතක තුවක්කුකරුවාද දැන් කොළඹ රෝහලේ ප්‍රතිකාර ලබයි. ඔහු යාපනයේ සිට පැමිණ මාස තුනක් පමණ වත්තල ප්‍රදේශ යේ නැවතී සිටි දෙමළ තරුණ යෙකු බව පොලීසිය සොයා ගෙන ඇත. ඔහු කවුරුන් විසින් එවන ලද තුවක්කු කරුවෙක්දැයි ළගදීම සොයාගත හැකි බව පරීක්ෂණ පවත්වන පොලීසිය කියයි. ඝාතකයා කොටි සංවිධානයේ සාමාජිකයෙකු බවද පොලීසිය කියයි. මෙයට කලින්ද මහේෂ්වරන්ට කීප විටක්ම වෙඩි තබා ඇත.

මහේෂ්වරන් මන්ත්‍රීවරයා නිතර වර්තමාන රජය විවේචනය කළේය. ඔහු කොටි සංවිධානයේ හිතවතෙකු බව ද ඇතැම් අය කියති. කොළඹ අවට ලොජ් නමින් හඳුන්වන ද්‍රවිඩයින්ගේ නවාතැන් වටලා කොටි සාමාජිකයන් අත්අඩංගුවට ගත් අවස්ථාවේ මහේෂ්වරන් ඊට එරෙහිව උද්ඝෝෂණය කළේය. මෑතකදී ඔහු අළුත්ම වාහනයක් කොටින්ට උතුරට ගෙනගොස් දුන් බව ද කියති. ඔහු කීවේ තමා උතුරට ගියවිට වාහනය කොටි උදුරාගත් බවයි. එසේම නැවක් කුලියට ගෙන උතුරේ සරණාගතයින්ට කෑම හා හා වෙනත් ආධාර ගෙන ගොස් දෙන නියායෙන් කොටින්ට ආයුධ සැපයූ බව ද දැන් කොටි පාවිච්චිකරන ගුවන්යානය තැනීමට අවශ්‍ය ආම්පන්න ගෙන ආවේ ඒ නැවේ බව ද ආරක්ෂක හමුදා පවසයි. මහේෂ්වරන් මන්ත්‍රීගේ ආරක්ෂාවට රජයෙන් සපයා තිබූ ආරක්ෂකයින් සංඛ්‍යාව මේ නොබෝදා අඩුකර ඇත. ඒ නිසා මෙම ඝාතනය පහසුවීයැයි විපක්ෂය දැන් රජයට චෝදනා කරයි. එහෙත් මෙම ඝාතනය කෙලින්ම එල්ටීටීඊ සංවිධානයේ සැලසුමක් බව රජය පවසයි.



බෝම්බය පිපිරුණු නිපොන් හෝටලයේ ඉදිරිපස (පහළ) විනාසවුණු හමුදා බස්රිය



# කොම්පඤ්ඤ වීදියේ කොටි බෝම්බයක් පිපිරේ

**ජ**නවාරි 2 දින උදයේ 9.30 ට කොළඹ කොම්පඤ්ඤවීදියේ නිපොන් හෝටලය ඉදිරිපිට දෙමළ කොටි ත්‍රස්තවාදීන් විසින් අටවන ලද බෝම්බයක් පිපිරීමෙන් හමුදා භටයෙකු ඇතුළු 3 ක් මරුමුවට පත්වූහ. තුවාලවුණු තවත් රාශියක් එනම් හමුදා භටයින් 11ක් හා සමාන්‍ය වැසියන් 17 දෙනෙක් කොළඹ මහ රෝහලට ගෙන යන ලදී. කොටි මෙම බෝම්බය ඉලක්කර ඇත්තේ එම පාරෙන් දිනපතා ධාවනය වන හමුදා භටයින් ගෙන යන බස්රියක් වෙත ය. මෙම බස් රථයේ එදින රැගෙන ගොස් ඇත්තේ හමුදාවේ රෝගී සොල්දාදුවන් පිරිසක් ප්‍රතිකාර සඳහා ය.

බෝම්බය හෝටලයේ පාරට නුදුරු බිත්තියේ සවිකර ඇති එයාර්කන්ඩිෂන් යන්ත්‍රය මත තබන ලදුව දුරස්ථ පාලක මෙවලමකින් ක්‍රියාකරවා පුපුරවා හැර ඇති බව පොලීසිය කියයි. එයින් හැඟෙන්නේ එය පිපිරවූ තැනැත්තා ඒ අවට තැනක බස් රථය එනතුරු බලා සිට බසය එම ස්ථානය පසුකරත්ම රිමෝට් යන්ත්‍රයෙන් එය පුපුරවන්නට ඇති බවයි. හමුදා බස් රථයට ද හා හෝටලයට ද බරපතල හානි සිදුව ඇත.

***කේ. එල්. කරුණාරත්න* Sri Lanka**

## ♥ පැටියෝ ඩාලිං



"පැටියෝ.... සංස්ථාවල සේවකයො සමගියෙන් එකා වගේ කැපවෙලා වැඩ කරනව නම් ඒ සංස්ථාවත් රටත් දියුණු වෙනවා කියලා ජනාධිපතිතුමාගේ නව අවුරුදු පණිවිඩයේ කියලා තිබුණා. "

"ඒක හරි ඇත්ත..... දැන් බලන්න රූපවාහිනියේ සේවකයෝ ඊයෙ පෙරෙයිදා එහෙම සමගියෙන් වැඩක් කරලා ලෝකෙටම පෙන්නුව නේ...."

# Sinhala Lesson 117 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Perfect Participle - පූර්ව ක්‍රියාව

**In the last lesson 116, I explained to you how the Perfect Participles work in Sinhala language.**

**Here are more Perfect Particples - පූර්ව ක්‍රියා**

to climb down බහිනවා
having climbed down - බැස / බැහැලා
to sell - විකුණනවා having sold විකුණා / විකුණලා
to climb - නගිනවා having climbed නැග / නැගලා
to go යනවා having gone ගොස් / ගිහින්
to open අරිනවා having opened ඇර / ඇරලා
to walk - ඇවිදිනවා having walked ඇවිද / ඇවිදලා

වඳුරා ගසින් බැස බිම ඉඳගත්තේය
හොරා ජනේලයෙන් පැන දිව්වේය
දඩයක්කාරයා මුවෙකු විද මැරුවේය
පීටර් කඩේට ගිහින් ආවේය
ආච්චි අපට කතාවක් කියා සිනාසුනාය

**Translate the above sentences into English.**

**Make perfect participles with:-** නටනවා, මරනවා, පීනනවා, වැඩකරනවා, දෙනවා, පදිනවා, තබනවා ,වහනවා, අඩනවා, එනවා, ගෙනෙනවා, අඳිනවා, සෙල්ලම්කරනවා

♦ ආචාර්‍යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 95

**හරහට :**
1 ලංකාවේ විකාර ඡන්ද ජාතිය
5 වත්සුණු.
6 ගම්පහ අයිති කෝරළය
8 කමිස වර්ගයක්
9 පුවත්පතක මේවා ඇත.
10 සුළඟ

**පහළට :**
1 මගේ පුතා
2 කකුළු කඩා වැටෙන්නේ මේවා යන විටය
3 ධ්‍යාන වැඩූ අයට මේවා දැකිය හැක. 4 ඇතුගල් පුර.
7 සිහාකන. 8. වී ගබඩා කරන තැන්

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | ■ | 4 |
| 5 | | | ■ | |
| | ■ | 6 | 7 | |
| ■ | 8 | | | |
| 9 | | ■ | 10 | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 මකර 5 යුගල 6 පාලම 8 පෙරවරු 9 සඳ 10 නවා
**පහළට:** 1 මයුර 2 කග 3 රලපාර 4 මගමරුවා 7 ලවන 8 පෙද

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# අන්නාසි කේක්

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| මිල්ක් මේඩ් උකුකිරි (ග්‍රෑම් 397) ටින් | 1 යි |
| බටර් | ග්‍රෑම් 125 යි |
| අන්නාසි පෙති | 6 යි |
| පිටි | ග්‍රෑම් 250 යි |
| බේකිං පවුඩර් | තේ හැඳි 1 යි |
| සෝඩා බයිකාබනේට් | තේ හැඳි 1 යි |
| සෝඩා වතුර | මි. ලී. 200 යි |
| කැරමල් සෑදීම සඳහා සීනි | මේස හැඳි 6 යි |

***සාදන ක්‍රමය :*** අඟල් 8 පමණ වූ හතරැස් කේක් තැටියක් බටර් තවරා සකසාගන්න. යාන්තමින් ස්ටූ කරගත් අන්නාසි පෙති එහි අඩියට අතුරාගන්න. වෙනත් භාජනයකට සීනි දමා දුඹුරු පැහැ දියරක් වන තෙක් රත්කරගන්න. එම උණු කැරමල් අන්නාසි පෙති මතට වත්කර සිසිල් වෙන්නට හරින්න. උණු වතුර බඳුනක් මත තබා හෝ මයික්‍රෝවේව් යන්ත්‍රයේ තබා හෝ බටර් ටික දියකර ගන්න. නිවුණු පසු එයට මිල්ක්මේඩ් කිරි සියල්ල එකතු කර හොඳින් බීට් කරගන්න.

පිටි, බේකිං පවුඩර් සහ සෝඩා බයිකාබනේට් එකට හලාගන්න. එම පිටිවලින් මේස හැඳි දෙකක් මිල්ක්මේඩ් මිශ්‍රණයට දමා හැඳිගාන්න. ඊට සෝඩා වතුර මේස හැඳි දෙකක් ද දමා හොඳින් බීට් කරගන්න. ඒ ආකාරයට පිටි හා සෝඩා වතුර ඉවරවන තෙක් වරින් වර දමා බීට් කරගන්න. දැන් මෙම මිශ්‍රණය සෑදූ විගසම අන්නාසි දමා සාදාගත් තැටියට වත්කර කලින් උශ්ණත්වය 150º රත්කරගත් උදුනක මිනිත්තු 30-40 ක් බේක් කරගන්න. උදුනෙන් ඉවතට ගත් විගස පිහියක ආධාරයෙන් කේක් එකේ පැති බුරුල්කර අන්නාසි උඩට සිටින සේ පිහානක් මතට බාගන්න.

♦ ***ස්වර්ණමාලි හේවාවසම්* Sri Lanka**

